1455


# නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - ඉඟිනිමිටිය
வதிவிட திட்ட முகாமையாளர் காரியாலயம் – இங்கினிமிட்டிய
**Resident Project Management Office - Inginimitiya**

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

වෙලේවැව
නවගත්තේගම
வெலேவெவ
நவகத்தேகம
Welewewa
Nawagaththegama


25 MAR 2019

මගේ අංකය / எனது இல. / My Ref No

ඔබේ අංකය / உமது இல. / Your Ref No

දිනය / திகதி / Date 2019/3/14

සියලුම ගොවි සංවිධාන සාමාජික මහත්ම /මහත්මීන් වෙත,
ඉඟිනිමිටිය /රදවිබැදි ඇළ ව්‍යාපාරය.

## මාසික ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තාව
## ඉඟිනිමිටිය /රදවිබැදි ඇළ ව්‍යාපාරය

වාරි මාර්ග ආඥා පනත යටතේ 1994 අංක 13 දරණ සංශෝධිත පනතට අනුකූලව ඉඟිනිමිටිය /රදවිබැදි ඇළ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසයට අදාළ මාසික ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම වාරිමාර්ග ,කෘෂිකර්ම,ගොවි ජන සේවා ,වාරිමාර්ග කළමණාකරණ අංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2019/03/11දින පෙ. ව.10. 00 ට ඉඟිනිමිටිය ව්‍යාපාර කළමණාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

### සහභාගි වු රාජ්‍ය නිලධාරීන්ගේ නාම ලේඛණය
### වාරි මාර්ග දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| 01.H.L.C.පුෂ්ප කුමාර මහතා | - ප්‍රා.වාරි.ඉංජිනේරු |
| 02.W.T.M.S.S.තෙන්නකෝන් මහතා | - ඉංජිනේරු සහකාර |
| 03.L.S.කලුආරච්චි මිය | - ඉංජිනේරු සහකාර |
| 04.B.M.R.P.බෝහිංගමුව මිය | - ඉංජිනේරු සහකාර |
| 05.M.A.C.ජයමාලි මිය | - ඉංජිනේරු සහකාර |
| 06.H.M.S.P.ගුණරත්න මහතා | - සංවර්ධන නිලධාරි |
| 07.R.H.M.ධර්මදාස මහතා | - ජලපාලක |
| 08.R.P.D.සුනිමල් පියතිස්ස මහතා | - ජලපාලක |
| 09.U.A.C.උබේසිංහ මහතා | - ජලපාලක |
| 10.M.M.සිසිර මහතා | - ජලපාලක |

### වාරිමාර්ග කළමණාකරණ අංශය

| | |
|---|---|
| 11.I.H.J.කුමාර මහතා | - නේවාසික ව්‍යාපාර කළමණාකරු |
| 12.H.M.දමයන්ති කුමාරි මිය | - සංවර්ධන නිලධාරි |

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| 13 A.M.D.S.අංගම්න මහතා | - කෘෂිකර්ම උපදේශක |

**ගොවිජන සේවා දෙපාර්තමේන්තුව**

14. D.M.R.B.දිසානායක මහතා - ගො.සං.ප්‍රා.නිළධාරී
15. R.I.B.M.රත්නමලල මහතා - කෘ.ප.නි.ස
16. R.H.M.J.බංඩාර මහතා - කෘ.ප.නි.ස
17. D.M.ඉන්ද්‍රාණී ජයරත්න මිය - කෘ.ප.නි.ස
18. K.A.ඥානතිලක මහතා - කෘ.ප.නි.ස
19. R.M.P.රණතුංග මහතා - කෘ.ප.නි.ස

**<u>සහභාගි වු ගොවි නියෝජිතයින්</u>**

20. K.P.R.D.රාජපක්ෂ මහතා - ලේකම් -ගල්කිස්ස අමුණ ගොවි සංවිධානය
21. W.M.සරත් වර්ණසුරිය මහතා - භාණ්ඩාගාරික-ගල්කිස්ස අමුණ ගොවි සංවිධානය
22. J.M.සරත් කුමාර මහතා - ලේකම් - එකමුතු නෙළුම්වැව ගොවි සංවිධානය
23. D.M.රණසිංහ මහතා - සභාපති - සුහද ගොවි සංවිධානය
24. R.M.ජයන්ත රත්නායක මහතා - සභාපති-මහසෙන් ගොවි සංවිධානය
25. D.M.ගුණසේන මහතා - සභාපති - රංකෙත ගොවි සංවිධානය
26. H.M.අනුර මහතා - ලේකම්- රංකෙත ගොවි සංවිධානය
27. S.N.S.B.සිරිසේන මහතා - සභාපති - ජනශක්ති ගොවි සංවිධානය
28. A.H.M.නිමල් ජයරත්න මහතා - සභාපති - ස්වර්ණපාලියාගම ගොවි සංවිධානය
29. A.H.M.ඩිංගිරි බණ්ඩා මහතා - ලේකම්- ඩී.එස්. සේනානායක ගොවි සංවිධානය
30. K.H.M.වසන්ත මහතා - සභාපති -ඩී.එස්. සේනානායක ගොවි සංවිධානය
31. A.H.M.විජේසිංහ මහතා - ලේකම් - ස්වර්ණපාලියාගම ගොවි සංවිධානය
32. R.M.අබේරත්න මහතා - සභාපති - පුබුදු ගොවි සංවිධානය
33. M.M..සුරේන්ද්‍ර මහතා - ලේකම් - කළ්‍යාණමිත්‍ර ගොවි සංවිධානය
34. R.M.S.මුදියන්සේ මහතා - සභාපති - අරුණළු ගොවි සංවිධානය
35. R.M.විජේසුරිය මහතා - සභාපති - නැගෙනහිර ගොවි සංවිධානය
36. A.H.M.චන්දන කුමාර මහතා - භාණ්ඩාගාරික- පුබුදු ගොවි සංවිධානය
37. S.W.M.චන්ද්‍රසේන මහතා - සභාපති - සාරකෙත ගොවි සංවිධානය
38. R.H.M.උපුල් ජයන්ත මහතා - සභාපති- ගැමුණු ගොවි සංවිධානය
39. K.A.B.අභයකිර්ති මහතා - සභාපති- එක්සත් ගොවි සංවිධානය
40. R.P.D.රූපසිංහ මහතා - සභාපති- පැරකුම් ගොවි සංවිධානය
41. R.P.D.ධර්මසේන මහතා - භාණ්ඩාගාරික - එක්සත් ගොවි සංවිධානය
42. H.M. අභයරත්න මහතා - ලේකම්-මහළස්වැව ගොවි සංවිධානය
43. B.M.S. රත්නසේකර මහතා - භාණ්ඩාගාරික - අශෝක ගොවි සංවිධානය
44. H.M. ජයසේන මහතා - ලේකම් - දිමුතු ගොවි සංවිධානය
45. R.P.D.සමන් පියරත්න මහතා - ලේකම් -සාලිය ගොවි සංවිධානය
46. W.M. මුතුබණ්ඩා මහතා - භාණ්ඩාගාරික -සුහද ගොවි සංවිධානය
47. J.M.ගුණවර්ධන මහතා - ලේකම් - නැගෙනහිර ගොවි සංවිධානය
48. P.P.චමින්ද ප්‍රනාන්දු - ගණන් පරීක්ෂක- එක්සත් ගොවි සංවිධානය
49. R.P.D. ගුණරත්න මහතා - ලේකම් - පැරකුම් ගොවි සංවිධානය
50. W.M.S.අජිත් සුරේන්ද්‍ර මහතා - සභාපති -එකමුතු ගොවි සංවිධානය
51. H.පියසිරි කුලතුංග මහතා - භාණ්ඩාගාරික -ගැමුණු ගොවි සංවිධානය

පසුගිය රැස්වීමේ දි තීරණය කර ගත් පරිදි ඒකාබද්ධ ව්‍යාපාර ගොවි සංවිධානයේ රැස්වීම ව්‍යාපාර කළමනාකරණ කමිටුවට පෙර පවත්වන ලදි.එසේම මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් කැලැන්ඩරයට අනුව යොදා ගත් දිනට පිරිත් පිංකම පැවැත්වෙන නිසා කලින් දැනුම් දි අද දින රැස්වීම යොදා ගත් බවද දන්වන ලදි.

ඒ අනුව ආගම සිහි කිරීමෙන් අනතුරුව සියලු දෙනා පිළිගත් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා න්‍යාය පත්‍රානුකූලව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

## 01.පසුගිය ව්‍යපාර කළමණාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය :-

පසුගිය ව්‍යපාර කළමණාකරණ කමිටු රැස්වීමේ දී ගත් තීරණ හා ගැටලු සහගත තත්වයක් පැන නැගි නොමැති බැවින් කළමණාකරණ කමිටු රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තිරණය විය.

★ පොහොර සහනාධාරය පිළිබඳව ගැටලුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ දි සාකච්ඡා කල බවත් පොහොර සහනාධාරය රජයේ ප්‍රතිපත්තියක් නිසා මින් පසු කන්න රැස්වීමේ දි එම තිරණ ගත යුතු බවත්,

★ යෝධ නිදිකුම්බා ශාකය පිළිබඳව නි.කෘ.අධ්‍යක්ෂක දැනුවත් කර ඇති බවත් දන්වන ලදි.

## 02.ආයතන සංවර්ධන කටයුතු :-

★ නිල කාලය අවසන්ව පවතින මහඋස්වැව පැරකුම් ගොවි සංවිධාන වල නිළවරණ කඩිනමින් පවත්වන ලෙසද,

★ කලාප ක්‍රමය පිළිබඳ පවතින ගැටළු පිළිබඳ සාකච්ඡා කිරිමේ වැඩමුළුව දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් 2019/03/26 වන දින නවගත්තේගම රංග ශාලාවේ දි පවත්වන බැවින් ඒ සඳහා සහභාගි වන ලෙස දැනුවත් කරන ලදි.

★ ඉදිරි කන්නයෙ ඇතිවිය හැකි රෝග පළිබෝධ පිළිබදව හා ගොවින්ට ඒ සම්බන්ධව දැනුවත් කිරිමේ පුහුණු වැඩසටහන් ඉදිරියේ දි පැවැත්විමට තිරණය කරන ලදි.

## 03.2018/19 මාස් කන්නයේ වගා ප්‍රගතිය.

★ සාලිය ගොවි සංවිධානයේ ඩී දෙක කොටසේ අක්කර 25 කට පමණ හා පැරකුම් ගොවි සංවිධානයේ ඩී පහ ඇළේ අක්කර 40 කට පමණ ජලය අවශ්‍ය බවද ගොවින් කන්න රැස්වීම් වලට අනුව ක්‍රියා නොකිරිම ප්‍රධාන හේතුව බවද,

★ මහසෙන්,රංකෙත,සුභද,ගොවි සංවිධාන සදහා ජලය අවශ්‍ය නොවන බවද,

★ ගැමුණු,සාරකෙත,දිමුතු,පුබුදු,ඌරියාව හා රදවිබැදිඇළ කොටස මේ වන විට අස්වනු නෙලිම අවසන් කර ඇති බවද,

★ අරුණළු,කල්‍යාණමිත්‍ර ,එකමුතු,මහඋස්වැව,ගොවි සංවිධාන වල මේ වන විට අස්වනු නෙලිම ආරම්භ කර ඇති බවද,

★ පෞද්ගලික වෙළදුන් භූතයාගෙන් අස්වනු නෙලූ පසු වි කිලෝව රු 30 බැගින්ද සුනාමි කරන ලද වි කිලෝව රු 34 -35 අතර මුදලකට ද වි මිලදි ගනු ලබන අතර රජය මගින් වි කිලෝව රු 38 මිලදි ගැනිම සිදු වන බවද දැනුවත් කරන ලදි,

## 04.2019/03/15 දින ඉහිණිමිටිය ජලාශය අසල පවත්වන ලද පිරිත් පිංකම

★ සෑම ගොවි සංවිධානයකින්ම ගොවින් දසදෙනෙකු සහභාගි කරවිම.

★ ස්වාමින් වහන්සේලා 15 නමකට උදේ හිල් දානය සකසා පිළිගැනවිම සාලිය පැරකුම් සංවිධාන වලට භාර වු අතර ඒ සදහා යන වියදම ඒකාබද්ධ ගොවි සංවිධානයෙන් ලබා දිමට තිරණය විය.

★ එම අවස්ථාවට අවශ්‍ය හට් සහ පුටු ඉහිණිමිටිය සිරිසග බෝ මරණාධාර සමිතියෙන් ලබා ගැනිමටද

★ ජලය ලබා ගැනිමට ජල ටැංකිය පැරකුම් ගොවි සංවිධානයෙන්ද,

★ පිරිත් මණ්ඩපය සකස් කිරිමට මහසෙන් ගොවි සංවිධානයෙන් සහයෝගය ලබා දිමටද,

★ ස්වාමින් වහන්සේලාගේ සහය සදහා පළපුරුදු කිප දෙනෙකු සම්බන්ධ වන ලෙසද දැනුවත් කරන ලදි,

## 05.වාරි මාර්ග දෙපාර්තමේන්තුව:-

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - ඒ.එල්.සී. පුෂ්ප කුමාර මහතා**

**ජලාශවල පවතින ජල ධාරිතාවයන්**

| ජලාශයේ නම | ජල ධාරිතාව අක් අඩි | සක්‍රීය ජල ධාරිතාව අක් අඩි |
|---|---|---|
| ඉගිනිමිටිය | 28000 | 20000 |

- ★ ඉදිරි කන්නයේ වගාව සම්බන්ධව 26 වන දින පවත්වන ලද වැඩමුළුවේ දී තිරණය කිරිමද දැදුරු ඔයෙන් ඉදිරි කන්නයේ දි ජලය ලබා ගැනිම සම්බන්ධව බලාපොරොත්තු තබා ගත නොහැකි බවද.
- ★ ගොවින් වගා කිරිමේ දි කන්න රැස්විම් තිරනණ ක්‍රියාත්මක නොකල බැවින් අමතර ජල මුර ලබා දිමට සිදු වන බවද.
- ★ ගොවි සංවිධාන සදහා අවශ්‍ය ජල අවශ්‍යතා ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ දි සාකච්ජා නොකර පසුව කාර්යාලයට පෞද්ගලිකව පැමිණ ජලය ඉල්ලිම සුදුසු නොවන බවද.
- ★ ඇළ වේලි වල යම් දුර්වලතා පැවතුණද ගොවින් කන්න රැස්විම් තිරණ ක්‍රියාත්මක නොකරන බැවින් අමතර ජල මුර ලබා දිමට සිදු වන බවද සාලිය පැරකුම් ගොවි සංවිධාන වල ජල අවශ්‍යතාවය ලිඛිතව ඉදිරිපත් කරන ලෙසද දැනුවත් කරන ලදි.
- ★ මහා වාරි ජලාශ වල 2018/03/15 වන දින පැවැත්විමට නියමිත පිරිත් පිංකමට සම්බන්ධ වන ලෙස දැනුවත් කරන ලදි.

**කෘෂි කර්ම දෙපාර්තමේන්තුව**

**ඒ,එම්"ඩි,එස්,අංගම්මන මහතා -කෘෂිකර්ම උපදේශක**

- ★ මෙම කන්නයේ දි මහළුස්වැව ප්‍රදේශයේ පුරුක් පණු රෝගය බහුලව දක්නට ලැබෙන බවත් ඒ සදහා ගොවින්ට අවශ්‍ය උපදෙස් ලබා දුන් බවද.
- ★ විශේෂයෙන් කන්නය පසුවී වගාව පිහිටු විම මෙයට ප්‍රබලව බලපෑ අතර පුරුක් පණු රෝගය මුල් අවස්ථාවේ දි හදුනාගෙන ප්‍රතිකාර කල යුතු බවත් රෝගය ව්‍යාප්ත විමෙන් පසු ඒ සදහා ප්‍රතිකාර කිරිමෙන් ඵලක් නොමැති බවද.
- ★ නිර්දේශිත පොහොර ප්‍රමාණය හා කාබනික පොහොර භාවිතය තුළින් පළිබෝධ හානිය යම් මට්ටමකින් පාලනය කල හැකි වේ,
- ★ වී වගාවේ කලු ඇට ඇති විම සිදු වන්නේ දිලිර රෝගයකින් වන බැවින් ඒ සදහා දිලිර නාශක භාවිත කල යුතුය.මෙම රෝගය ඇති වන්නේ මහ බණ්ඩි අවස්ථාවේ දි වන බැවින් දින 50/60අතර කාලය තුළ ප්‍රතිකර්ම කල යුතුය. දිලිර නාශක යෙදිම සුදුසු බවත් දන්වන ලදි,
- ★ ඉදිරි කන්නයේ දි වැසි ජලය උපයෝගි කර වගාව පිහිටුවා ජලය කළමනාකරණය කර ගන්නා ලෙසද.
- ★ වගාවන් වල සිදුවන පළිබෝධ හා දිලිර රෝග පිළිබදව අවශ්‍ය කෘෂිකාර්මික උපදෙස් ලබා දිමට කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ මසකට එක් දිනක් අනිවාරයෙන් එම ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක මහතෙකු රැදි සිටින බවද.

**ගොවිජන සේවා දෙපාර්තමේන්තුව**

**D.M.R.B.දිසානායක මහතා - ගො.සං.ප්‍රා.නිළධාරි**

- ★ ගොවින්ගේ පාරම්පරික සිරිත් විරිත් නැවත අනුගමනය කල හොත් වගාවේ දි ඇතිවන රෝග පළිබෝධ අවම කරගත හැකි බවද.
- ★ අනුරාධපුරය ජය ශ්‍රිමා බෝධිය අසල අප්‍රේල් 6/7 දෙදින පවත්වන ලද අලුත් සහල් මංගල්‍යට හැම ගොවියෙකුගෙන්ම හාල් මිට බැගින් එකතු කර ලබා දෙන ලෙසද.
- ★ ගොවිජන කාරක සභාවේ සාමාජික ගණන 10 වන අතර අද දින එම කාරක සභාවට ඉදිරිපත් විමට බලාපොරොත්තු වන ගොවි සංවිධාන නාම ලේඛණ ලබා දෙන ලෙසද ඒ අනුව එම කාරක සභාවට සහභාගි වන

නියෝජිතයාගේ නම සදහන් කොට ලිඛිතව ඉදිරිපත් කරන ලෙසද ඒ අනුව පහත ගොවි සංවිධාන නම් කරන ලදි.

**දකුණු ඉවුර - සාලිය /ගැමුණු/එක්සත්/සාරකෙත/පුබුදු**

**වම් ඉවුර - රංකෙත එකමුතු/මහළුස්වැව/අරුණළු**

- ★ ඉදිරියේ දි ගොවි සංවිධාන නම් කරන ලද නියෝජිතයින් සමග ගොවිජන කාරක සභාව ගොවිජන සේවා කාර්යාලයේ පැවැත්විමට දැනුවත් කරන බව දන්වන ලදි.
- ★ මේ දින වල වී මිල දි ගැනිම සිදු වන අතර පොහොර නාම ලේඛණය වී අලවි මණ්ඩලයට ලබා දි ඇති බවද.
- ★ හිලවී කරන ලද පොහොර සම්බන්ධ ගොවින්ට ගැටළුවක් මතු වුවහොත්තම බල ප්‍රදේශය භාර කෘ. ප .නි.ශ නිළධාරින්ගේ නිර්දේශිත ලිපියක් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙසද.

**I.H.J.කුමාර මහතා - නේවාසික ව්‍යාපාර කළමණාකරු**

අමාත්‍යංශය මගින් බක් මහේ පුජාව නමින් වැඩසටහනක් ඉදිරියේ දි ක්‍රියාත්මක කරන බැවින් ඒ සදහා ගොවින්ට ගොයම් පදුරක් ගලවා පුජාව සදහා තබන ලෙස දැනුවත් කරන ලදි.

**W.M.S.අජිත් සුරේන්ද්‍ර මහතා - සභාපති -එකමුතු ගොවි සංවිධානය**

- මේ වන විටද පොහොර ලබා ගැනිමේ බිල්පත් ගොවින්ට ලැබි නොමැති හෙයින් එය ලැබෙන අයුරු පිළිබද විමසන ලදි.

පිළිතුරු - අදාළ බල ප්‍රදේශයේ කෘ. ප .නි.ශ නිළධාරින්ගෙන් ලබා ගන්නා ලෙස දැනුවත් කරන ලදි.

**S.W.M.චන්ද්‍රසේන මහතා - සභාපති - සාරකෙත ගොවි සංවිධානය**

- අස්වනු නෙළිමට යන්ත්‍ර සුත්‍ර වල ගැටළුවක් මතු වු අතර ඒ අනුව අස්වනු නෙලිමේ මිලද ඉහල යාම මගින් ගොවින් දැඩි අපහසුතාවයට පත් වු බවත්,
- බිත්තර වී ගෙන් විමේ දි කෘෂිකර්ම දෙප නිර්දේශිත වී ගෙන් විය යුතු බවත්

**K.A.B.අභයකිර්ති මහතා - සභාපති- එක්සත් ගොවි සංවිධානය**

- මෙම යන්ත්‍ර සුත්‍ර සම්බන්ධව ගැටළුව ජාතික මට්ටමට ගෙන ගොස් කතා කල යුතු බවද එය ඒකාබද්ධ ගොවි සංවිධානයේ නිළධාරින්ගේ වගකිම බවද සදහන් කරන ලදි.එසේම ජාතික ගොවි සංවිධානයේ පසුගිය දින පැවැත් වු රැස්විමට සහභාගි විම පිළිබදව කරුණු විමසන ලදි.

ඒ අනුව න්‍යාය පත්‍රානුකූලව සාකච්ජා කල යුතු කරුණු නිමාවට පත් වුයෙන් ප.ව.2.30 ට පමණ මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ කටයුතු නිමාවට පත් විය.

.........................

අයි. එච්. ජේ. කුමාර,
නේවාසික ව්‍යාපාර කළමණාකරු
ඉගිණිමිටිය ව්‍යාපාරය.

පිටපත් -

| | | | |
|---|---|---|---|
| 07. | දිස්ත්‍රික් ලේකම් - පුත්තලම | - | කා. දැ. ගැ. පි. |
| 08. | අධ්‍යක්ෂ- වාරිමාරග කළමණාකරණ අංශය - කොළඹ | - | එම |
| 09. | සහකාර කොමසාරිස්(ගොවිජන සේවා) -ආනමඩුව | - | එම |
| 10. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - | එම |
| 11. | ප්‍රාදේශිය වාරිමාරග ඉංජිනේරු- ඉගිණිමිටිය කොට්ඨාශය | - | එම |
| 12. | ව්‍යා කළ ගොනුවට | | |